https://www.nipunadhamma.org

රාජ සූත්‍රය

(සෝතාපත්ති අංග හතර)

පූජ්‍යපාද දොළොස්වල උදිතධීර හිමි

රාජ සූත්‍රය

වාසනාවන්ත පින්වත්නි,

අද අපි ඉගෙන ගන්නෙ සංයුක්ත නිකායේ සෝතාපත්ති සංයුත්තයේ තියෙන ලස්සන දේශනාවක්. ලෝකෙ තියෙන ලස්සනම දේ ධර්මය කියලයි මට හිතෙන්නේ. ධර්මය තුළ තියෙන්නේ අනික් ලස්සන දේවල් වල තියෙන ලක්ෂණය නෙවෙයි. අපි හිතමු ලස්සනම ලස්සන ගැණු ළමයෙක් හරි පිරිමි ළමයෙක් හරි මේ ශාලාව මැදින් තාලෙට යනව. එහෙම ගියොත් එහෙම බලනවද? නැද්ද . බලනව. බලන්නේ මොකද? එයා දිහා බලන කොට හිතට අමුතුම වෙනසක් දැනෙනව. මොහොතකට වෙනම ලෝකයකට යනව. මේ වෙනස තමයි ආශාව. ලස්සන කෙනෙක් දිහා හරි, ලස්සන දෙයක් දිහා හරි බලන කොට, හිතන කොට හිතේ ආශාව හට ගන්නව. මම ඉස්සෙල්ලම කිව්ව ලෝකෙ තියෙන ලස්සනම දේ ධර්මය කියලා. රූප දිහා බලනව වගේ ධර්මය දිහා බලන්න බෑ. ධර්මය දිහා බලන්න පුළුවන් අවබෝධය තුළින්. ලස්සන කොනෙක් දිහා බලන කොට ආශාව හටගන්නව. මේ ලස්සන ධර්මය අහන කොටත් ආශාව හට ගන්නවද? හෘද සාක්ෂියට එකඟවම කියන්න. සමහර අයට හිතෙනවා ඇති ධර්මය අහන කොට ආශාව හට ගන්නේ නැහැ කියලා. ඒක වැරදියි. ධර්මය අහන කොටත් ආශාව හට ගන්නව. හැබැයි ඒ ආශාව කෙලෙස් සහිත ආශාවක් නෙවෙයි. කෙලෙස් වලට අයිති නැති ආශාවක්. ඒ ආශාවට කියන්නේ නිරාමිස ආශාව කියල. බලන්න මේ ලස්සන ගාථාව.

සුඤ්ඤාගාරං පවිට්ඨස්ස
සන්තචිත්තස්ස භික්ඛුනෝ
අමානුසී රතී හෝති
සම්මා ධම්මං විපස්සතෝ

නිදහස් විවේක තැනකට ගිහිල්ල හිත තැන්පත් කරගෙන විදර්ශනා භාවනාව වැඩුවොත් සාමාන්‍ය මිනිසුන්ට ඇති නොවන නිරාමිෂ ආශාවක් උපදිනව.

බුදු රජාණන් වහන්සේ ධර්ම දේශනා කළේ ආශාව නැති කර ගන්න. පුදුමය කියන්නේ ඒක නෙවෙයි. ආශාව තියෙන මිනිස්සු ආශාව නැති කරන ධර්මය අහන්න කැමති වෙනව. මේකම මේ ධර්මයේ තියෙන ආශ්චර්යවත් බවක්. විෂෙන් විෂ නසනව වගේ ආශාවෙන් ආශාව නැති කරන්න පුළුවන්. එහෙම කියල නිවන් දකින අදහසින් පේන- ඇහෙන හැම දේටම ආසා කරන්න යන්න එපා. විෂෙන් විෂ නසනව වගේ ආශාවෙන් ආශාව නැති කරන්න පුළුවන් කියලා පොඩි හාමුදුරුවොත් කිව්ව. දැන් ඉතින් නිවන් දකින ඒක ලේසියි. කරන්න තියෙන්නෙ හැම දේටම ආශා කරන එක කියල අළුත් ම ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න එපා.

සමහර අය සත්තු මරන්න ආශයි. සමහර අය හොරකම් කරන්න ආශයි. සමහර අය පර පුරුෂ ඇසුර ලබන්න ආශයි. සමහර අය වෙනත් කාන්තාවන් සමඟ වරදේ බැඳෙන්න ආසායි. බොරු කියන්න ආශ අය ඉන්නවා. අරක්කු සිගරට් බොන්න ආශා අය ඉන්නව. මේ ආශා කරන්නේ දුස්සීල බවට. ඒ ඇත්තෝ කොහොම හරි සිල්වත් බවට ආශාව ඇති කර ගන්න ඕනි. සීලය කෙරෙහි ආශාව උපදවාගෙන දුස්සීල බව කෙරෙහි ආශාව නැති කරන්න ඕනි.එක කොණක් අල්ලගෙන ඕනි අනික් කොණ අත හරින්න නැතිව බෑ.

එහෙනම් මේ ලස්සන ධර්ම දේශනාව ඉතාම ආශාවෙන් අහන්න.මේ ධර්මය ලස්සන කතාවක් වගේ ම අහගෙන ඉන්න බෑ.මොකද ධර්මය තියෙන්නේ හුරතල් කරන්න නෙමෙයි.ධර්මය තියෙන්නේ අවබෝධ කරන්න.ආශාව උපදවා ගත්තොත් මේ දේශනාවම මතකෙ තියා ගන්න පුළුවන්.මේ දෙශනාවේ නම "රාජ" සූත්‍රය. සක්විති රජතුමා ගැන

වෙනවා.ඒක නිසා තමයි රාජ සූත්‍රය කියන්නෙ. මේ සූත්‍රය දේශනා කළේ සැවැත් නුවර ජේතවනාරාමයේදී. උන්වහන්සේ දේශනාව ආරම්භ කරනව.

මහණෙනි, සක්විති රජතුමා දිවයින් හතරක අධිපති බව දරමින් රාජ්‍ය පාලනය කරනව. ධාර්මිකව රාජ්‍ය පාලනය කරලා මරණින් මතු දෙව්ලොව උපදිනව. සක්විති රජතුමා මැරිල උපදින්නෙ තව්තිසා දෙව්ලොව. තව්තිසා දෙව්ලොවේදී නන්දන වනයට ගිහිල්ල දිව්‍ය අප්සරාවන් පිරිවරාගෙන සතුටු වෙනව.පස්කම් සැප විඳිනව.දිවයින් හතරක් පාලනය කරන සක්විති රජතුමා මැරිල දිව්‍ය ලෝකයේ ඉපදිලා සැප විඳිනව.ඒ වුනාට එයා නිරයෙන් නිදහස් වෙලාද?නෑ.තිරිසන් ලෝකයෙන් නිදහස් වෙලාද?නෑ.ප්‍රේත ලෝකයෙන් නිදහස් වෙලාද?නෑ.අසුර අපායෙන් නිදහස්ද?නෑ.

සෝතාපත්ති අංග හතර

බුදු රජාණන් වහන්සේ දේශනා කරනව,ආර්ය ශ්‍රාවකයා පිණ්ඩපාතෙ ගිහිල්ල ජීවත් වෙන්නෙ.සිදලා-බිදල මහපු සිවුරු අඳින්නෙ.ඒ වුනත් ධර්මතා ගුණ ධර්ම හතරකින් යුක්තයි.

මොනවද මේ ගුණ ධර්ම හතර.මාත් සමගම කියන්න.

(එක)- බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන පැහැදීම.

(දෙක)- ධර්මය කෙරෙහි නොසෙල්වෙන පැහැදීම.

(තුන)- සංඝ රත්නය කෙරෙහි නොසෙල්වෙන පැහැදීම.

(හතර)- ආර්ය කාන්ත සීලය.

ආර්ය ශ්‍රාවකයාට සක්විති රජතුමාට වගේ දිවයින් හතරක් පාලනය කරන්න නෑ.ඒ වුනාට ගුණ ධර්ම හතරක් තියෙනව.මේ ගුණධර්ම හතර නිසා ඔහු මේ ජීතයේදීම,

1.නිරයෙන් නිදහස් වෙලා.

2.තිරිසන් ලෝකයෙන් නිදහස් වෙලා.

3.ප්‍රේත ලෝකයෙන් නිදහස් වෙලා.

4.අසුර අපායෙන් නිදහස් වෙලා.

බලන්න කොච්චර වාසනාවක්ද කියලා.ගුණ ධර්ම හතරක් තියෙනව.ඒ හතර තමාගේ ජීවිතය තුළ ඇති කර ගත්තොත් මේ ජීවිතයේදීම සතර අපායෙන් නිදහස්.අපිත් මේ ගුණධර්ම හතර ඇති කරගෙන මේ ජීවිතයේදීම සතර අපායෙන් නිදහස් වෙන්න ඕනි.මේ ගුණධර්ම හතරට කියන්නේ සෝතාපත්ති අංග හතර කියල.යම් කෙනෙක් සෝවාන් ඵලයට පත් වෙන්න ආශ නම් මේ ගුණ හතර ජීවිතේ තුළ ඇති කර ගන්න ඕනි.සෝතාපත්ති ඵලයට පත් වුනහම මේ ගුණ හතර ස්ථිරවම ජීවිතය තුළ පිහිටනව.දැන් අපි මේ ගුණ හතර බලමු.

පළවෙනි ගුණය මොකක්ද? බුද්ධ රත්නය කෙරෙහි නොසෙල්වන පැහැදීම.ඒ කිව්වේ බුදුගුණ දැනගෙන , අවබෝධයෙන් බුද්ධ රත්නය පැහැදෙන්න ඕනි. නියම විදිහට නම් මේ ධර්ම දේශනාවේදී බුදුගුණ විස්තර කරල කියල දෙන්න ඕනි. ඒකට වෙලාව මදි. අපි හැම දෙනාමෙ බුදුගුණ දන්න නිසා කෙටියෙන් බුදුගුණ ටික බලමු.

බුදුගුණ

මොකක්ද පළවෙනි බුදු ගුණය. අරහං. අරහං කියන්නෙ කෙලෙස් නැති බව. බුදුරජාණන් වහන්සේ තුළ ආශාව , තරහ , මුලාව, ඉරිසියාව වගේ කෙලෙස් නෑ. අපි අඩන්නෙ, වැළපෙන්නෙ දුක්වෙන්නෙ, බය වෙන්නෙ කෙලෙස් නිසා. අපේ හිතේ කොච්චර කෙලෙස් තියෙනවාද ? මේ හිතේ ෆෝටෝ එකක් ගත්තොත් ඒක තමන්ටවත් බලන්න බැරි තරම් අප්‍රසන්නයි. අපේ වාසනාවකට කෙලෙස් තියෙන අපි නිකලෙස් මහා මුනිවරයාණන් සරණ ගියා. ඒ නිකලෙස් මහා මුනිවරයාණන් ගැන මා කිව්වට පසු මේ විදිහට කියන්න.

මාගේ ස්වාමී වූ , බුදුරජාණන් වහන්සේ,

සියලු කෙළෙසුන් , දුරු කළ සේක.

කෙලෙස් සතුරන් නැසූ සේක.

සංසාර චක්‍රයේ , කෙලෙස් අර බිඳ දැමූ සේක.

සියලු ලෝ වැසියන්ගේ , ආමිෂ පූජා , ප්‍රතිපත්ති පූජා සියල්ලටම, සුදුසු වන සේක.

රහසින්වත් , පව් නොකල සේක. බුදු රජාණන් වහන්සේ ,

අරහං වන සේක ///

බුදු රජාණන් වහන්සේ සතු දෙවන ගුණය සම්මා සම්බුද්ධ . සම්මා සම්බුද්ධ කියන්නේ වචන තුනක්. සම්මා කියන්නෙ ඉතාම හොඳින් - ඉතා මැනවින්, සම් කියන්නේ - තමන් වහන්සේම, බුද්ධ කියන්නෙ අවබෝධ කළා. ඉතා මැනවින් ඉතා හොඳින් තමන් වහන්සේම අවබෝධ කළ නිසයි. සම්මා සම්බුද්ධ කියන්නේ. අපි මෙය හඳුන්වන්නේ ගුරු උපදේශ නැතිව අවබෝධ කිරීම කියලයි. කවදාවත් කාගෙන්වත් අහල තිබුණෙ නැති ධර්මය ගුරු උපදේශ නැතිව අවබෝධ කළ නිසා ඒ මහා මුනිවරයා සම්මා සම්බුද්ධ නම් වෙනව. අපි සම්මා සම්බුද්ධ ගුණය මෙනෙහි කරමු. මා කිවාට පසු කියන්න.

- මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ දුක්ඛ ආර්ය සත්‍ය ගුරු උපදේශ නැතිව අවබෝධ කළ සේක.
- දුක්ඛ සමුදය ආර්ය සත්‍ය ගුරු උපදේශ නැතිව ප්‍රහාණය කළ සේක.
- දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය ගුරු උපදේශ නැතිව සාක්ෂාත් කළ සේක.
- දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාව නම් ආර්ය සත්‍ය ගුරු උපදේශ නැතිව වඩා නිම කළ සේක.
- බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධ වන සේක. ///

තුන්වන බුදු ගුණය

තුන් වන බුදු ගුණය විජ්ජාචරණ සම්පන්න ගුණයයි. විද්‍යා කියන්නේ අවබෝධය. චරණ කියන්නේ සීලය. උන්වහන්සේ ගේ අවබෝධය සුවිශාලයි. ඒත් තථාගතයන් වහන්සේම විද්‍යා අටක් අෂ්ට විද්‍යා කියලා දේශනා කළා.

චරණ කියන්නේ සීලය. උන්වහන්සේගේ සීලය කොටස් පහළොවකට බෙදල පසළොස් චරණ ධර්ම දේශනා කරල තියෙනවා. අෂ්ට විද්‍යා පසළොස් චරණ ද්‍රර්මයන්ගෙන් යුක්ත වන නිසා ඒ භාග්‍යවතුන් වහන්සේ විද්‍යා චරණ සම්පන්න නම් වෙනව. අපි විද්‍යා චරණ සම්පන්න ගුණය මෙනෙහි කරමු. කපුරුන් දෙනෙත් පියාගෙන මේ විදිහට හිතන්න. කියන්න එපා.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ

(1). විදර්ශනා ඤාණයෙන් යුක්ත වන සේක.

(2). මනෝමය ඉර්ධි ඤාණයෙන් යුක්ත වන සේක.

(3). ඉද්ධි විධ ඤාණයෙන් යුක්ත වන සේක.

(4). දිබ්බ සෝත ඤාණයෙන් යුක්ත වන සේක.

(5). පරචිත්ත විජානන ඤාණයෙන් යුක්ත වන සේක.

(6). පුබ්බෙ නිවාසානුස්සති ඤාණයෙන් යුක්ත වන සේක.

(7). දිබ්බ චක්ඛු ඤාණයෙන් යුක්ත වන සේක.

(8.) ආසවක්ඛය ඤාණයෙන් යුක්ත වන සේක.

(1). සීල සංවරයෙන් යුක්ත වන සේක.

(2). ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වන සේක.

(3). භෝජනයේ පමණ දන්නා බවින් යුක්ත වන සේක.

(4). ජාගරියානු යෝගයෙන් යුක්ත වන සේක.

(5). සද්ධා ගුණයෙන් යුක්ත වන සේක.

(6). පාපයට ලැජ්ජාව නම් වූ හිරි ගුණයෙන් යුක්ත වන සේක.

(7). පාපයට භය නම් වූ ඔත්තප්ප ගුණයෙන් යුක්ත වන සේක.

(8). බහුස්සුත ගුණයෙන් යුක්ත වන සේක.

(9). වීර්ය ගුණයෙන් යුක්ත වන සේක.

(10). සති ගුණයෙන් යුක්ත වන සේක.

(11). ප්‍රඥා ගුණයෙන් යුක්ත වන සේක.

(12). පළමු වන ධ්‍යානයෙන් යුක්ත වන සේක.

(13). දෙ වන ධ්‍යානයෙන් යුක්ත වන සේක.

(14). තුන් වන ධ්‍යානයෙන් යුක්ත වන සේක.

(15). හතර වන ධ්‍යානයෙන් යුක්ත වන සේක.

බුදු රජාණන් වහන්සේ අෂ්ට විද්‍යා පසලොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත වන නිසා විජ්ජා චරණ සම්පන්නෝ වන සේක///

දැන් හැමෝම ඇස් අරින්න.

හතර වන බුදු ගුණ

හතර වන බුදු ගුණය සුගතෝ .බුදු ගුණ අලංකාරයේ මේ ගුණය ලස්සනට කිව්ව.

යහපත් කොට යෙතැයි.
සුන්දර තැනට සැපතැයි.
සොඳුරු බස් කියැතැයි.
කියති ඒ මුනි රජුට සුගතැයි.

සුගතෝ කියන්නේ යහපත් කොට ගමන් කළා කියන එක. ඒ බුදු රජාණන් වහන්සේ බුදු මග පටන් ගත්තේ දීපංකර පාදමූලයෙන් නියත විවරණ ලබාගෙන.එදා පටන් හෙට බුදු බව ලැබෙනව වගේ හිතාගෙන පාරමී-උප පාරමී- පරමත්ථ පාරමී පුරමින් බුද්ධ රාජ්‍යයට වැඩම කළා. බුදු බවට පත් වෙන්නෙ පිළිවෙලින් සෝවාන්- සකෘදාගාමී, අනාගාමී, අරිහත් කියන මාර්ග ඵල පිළිවෙලින්. ඒ ඒ මාර්ගයන්ගෙන් වෙන වෙනම කෙලෙස් නැති වුනා. ඒ නැති වෙච්ච කෙළෙස් ආයෙ කවදාවත් ඇති වුනේ නෑ.

ඉස්සර හාමුදුරු කෙනෙක් හොඳට භාවනා කළා.උන්වහන්සේගේ හිතේ කෙලෙස් උපදින්නේ නැතුව ගියා. උන්වහන්සේ

හිතුවා මම දැන් රහත් වෙලා කියලා. කාලයක් ගියාට පස්සේ මේ හාමුදුරුවෝ පන්සල ඉස්සරහ ඉන්නවා.පන්සලේ ගේට්ටුව වෙත ලස්සන ගෑනු ළමයෙක් ආවා.ඇඳුමත් අසංවරයි.මේ හාමුදුරුවන්ගේ හිතේ ආශාව ඇති වුනා. එදාලු දැන ගත්තේ තවම රහත් වෙලා නෑ කියලා.භාවන කරන සමහර අය ඔය විදිහට රැවටෙනව.

බුදු රජාණන් වහන්සේගේ හිතේ නැති වුන කෙලෙස් පිරිනිවන් පාන තෙක්ම හට ගත්තේ නෑ. කෙලෙස් නූපදවමින් ගමන් ගත් නිසත් උන්වහන්සේට සුගත කියනව. සුන්දර වු නිර්වානයට වැඩම කළ හන්දත් සුගත කියනව. සුන්දර වූ මිහිරි වචනම කතා කළ නිසාත් සුගත කියනවා. දැන් අපි සුගත ගුණය සිහි කරමු. කවුරුත් ඇස් පියා ගන්න. මෙ විදිහට හිතන්න. කියන්න එපා.

- මාගේ ස්වාමි වූ බුදු රජාණන් වහන්සේ දිපංකර පාදමූලයේ පටන් බෝධි මණ්ඩලය දක්වා පාරමි- උප පාරමි- පරමත්ථ පාරමි පුරමින් වැඩම කළ නිසා සුගත වන සේක.
- බුද්ධ රාජ්‍යයට පත් වූ මොහොතේ පටං පිරිනිවන් පාන මොහොත දක්වා ප්‍රහීණ කළ කෙලෙස් නැවත නූපදවමින් ගමන් ගත් නිසා සුගත වන සේක.
- සුන්දර වූ නිර්වාණස්ථානයට වැඩම කළ නිසා සුගත වන සේක.
- සුන්දර වූ මිහිරි වචනම කතා කළ නිසා සුගත වන සේක.
- බුදුරජාණන් වහන්සේ සුගත වන සේක. ///

පස්වන බුදු ගුණය

පස්වෙනි බුදුගුණය ලෝක විදූ. ලෝක විදූ කියන්නේ ලෝකය අවබෝධ කළ කෙනා කියන එක. මෙහි ලෝකය කියන්නෙ පංච උපාදාන ස්කන්ධය. පංච උපාදානස්කන්ධය ලෝකය බවත්, එය දුක්ඛ ආර්ය සත්‍ය බවත් අවබෝධ කළා. පංච උපාදානස් ස්කන්ධය හට ගන්නේ

පූර්වභව තණ්හාව නිසා. පූර්ව භව තණ්හාව කියන්නේ පෙර ජීවිතවල ඉඳන් පැවත එන ආශාවට. එය ලෝක සමුදය බව අවබෝධ කළා. සමුදය කිව්වේ හටගැනීම. පංච උපාදානස්කන්ධයත් එයහ ට ගැනීමට හේතුව වූ තණ්හාවත් ඒ කිව්වේදුක්ඛ සත්‍ය හා සමුදය සත්‍ය යන දෙකේම නැති වීම ලෝක නිරෝධය බව අවබෝධ කළා. ආර්ය අෂ්ටාංගික මාර්ගය ලෝකයෙන් නිදහස් වන මාර්ගය බව අවබෝධ කළා.

බුදුරජාණන් වහන්සේ හමු වීමට දවසක් රෝහිතස්ස කියල දෙවි කෙනෙක් ආවා. ඒ දෙවිකෙනා අහනවා බුදුරජාණන් වහන්ස යම් තැනක උපදින්නේ නැත්නම්, යම් තැනක වයසට යන්නෙ නැත්නම්, යම් තැනක මිය යන්නෙ නැත්නම් , චුත වෙන්නෙ නැත්නම්, නැවත උපදින්නේ නැත්නම්, ඒ ලෝකයේ කෙළවරට පා ගමනින් යන්න පුළුවන් ද කියල. කෙටියෙන්ම මෙයා අහන්නේ ලෝකෙ කෙළවරට පා ගමනින්ම යන්න පුළුවන්ද කියල. බුදුරජාණන් වහන්සේ දේශනා කළා. ලෝකෙ කෙළවරට පා ගමනින් යන්න බෑ කියලා. ඒ දෙවි කෙනා කියනවා බුදුරජාණන් වහන්ස ඒක නම් හරියටම හරි. ඊට පස්සේ එයා මහා පුදුම හිතෙන කතාවක් කිව්ව. බුදුරජාණන් වහන්ස මම පෙර ජීවිතේ රෝහිතසස කියලා ඉසිවරයෙක් වෙලා හිටියා. මට ඉර්ධිබල තිබුණා. අහසින් ගමන් කරන්න පුළුවන්. ඒ වගේම ඉර්ධි බලයෙන් ඈතින් පාද තියලා ඇවිදින්න පුළුවන්. එක පාදයක් නැගෙන හිර මුහුදේ තිබ්බොත් ඊලග පාදය තියන්නේ බටහිර මුහුදේ කියලා. බලන්න හරිම පුදුමයි.එත් සත්‍ය කතාවක්. ඉතිං මේ ඉසිවරයාට හිතුන ලෝකෙ කෙළවරට පා ගමනින් යන්න ඕනි කියල. එයා ලෝකෙ කිව්වේ පෘතුවියට නෙවෙයි. සක්වළට. ඒ කිව්වෙ දිව්‍ය ලෝක හයයි - බ්‍රහ්ම ලෝක 16 යි. මනුස්ස ලෝකය යි. අපාය හතරයි . ඉතිං මේ ඉසිවරයා ලෝකෙ කෙළවර හොයාගෙන ඇවිදින්න පටන් ගත්තා. කෑම කන වෙලාව වැසිකිළි කැසිකිළි යන වෙලාව විවේක ගත්තා. අනික් හැම වෙලාවෙම ඇවිද්දා. එයා අවුරුදු සියක් ජීවත් වුනා. අවුරුදු 100 ක් ම ඇවිද්දා. අතරමගදී මැරුණ. ඉතිං මේ දෙවිකෙනා

බුදුරජාණන් වහන්සේ ට මේ කතාව ප්‍රකාශ කලා. බලන්න එච්චර බලයක් තියෙන කෙනෙකුට ලෝකේ කෙළවරට යන්න බැරි වුවානම් , කාටද යන්න පුළුවන් කියල.

බුදුරජාණන් වහන්සේ ඒ දෙව්කොනට කියලා දෙනව. දිව්‍ය පුත්‍රය මම බඹයක් පමණ වූ මේ ශරීරයේ ලෝකයත්, ලෝකය හට ගැනීමට හේතුවත්, ලෝකයෙන් නිදහස් වීමත්, ලෝකයෙන් නිදහස් වන මාර්ගයත් දේශනා කරමි කියලා. බුදු දහම ඉගැන්වෙන හැටියට දුකෙන් නිදහස් වෙන්න ලෝකය අවබෝධ කරන්න ඕනි. ලෝකය කිව්වේ පංච උපාදානස්කන්ධය. බුදුරජාණන් වහන්සේ පංච උපාදානස්කන්ධ ලෝකය අවබෝධ කළා. ඒකයි උන්වහන්සේට ලෝක විදූ කියන්නේ. දැන් අපි ලෝ ක විදූ බුදු ගුණය සිහි කරමු. කවුරුත් ඇස් පියා ගන්නං ඉරියව්ව වෙනස් කරන්න ඕනි නෑ. ඔය ඉන්න විදිහටම ඇස් පියා ගන්න. මේ විදිහටම හිතන්න. කියන්න එපා.

ලෝක විදූ

- මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ පංච උපාදානස්කන්ධ ලෝකය දුක්ඛ ආර්ය සත්‍ය බව අවබෝධ කල සේක.
- පංච උපාදානස්කන්ධ ලෝකයේ හට ගැනීමට හේතුව වූ පූර්වභව තණ්හාව සමුදය ආර්ය සත්‍ය ලෝක සමුදය බව අවබෝධ කල සේක.
- පංච උපාදානස්කන්ධය ලෝකය හා එය හට ගැනීමට හේතුව වූ තණ්හාව නැති කිරීම ලෝක නිරෝධය බව අවබෝධ කල සේක.
- පංච උපාදානස්කන්ධ ලෝකයෙන් එතෙර වන මාවත නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය ලෝකයෙන් එතෙර වන මාර්ගය බව අවබෝධ කළ සේක.
- බුදුරජාණන් වහන්සේ ලෝක විදූ වන සේක .///

හයවන බුදු ගුණය

හයවන බුදු ගුණය අනුත්තරෝ පුරිස දම්ම සාරථී. අනුත්තරෝ කියන්නෙ උසස් , උතුම් කියන එක. තථාගතයන් වහන්සේට වඩා උසස් කෙනෙක් ලෝකයේ නෑ. න උත්තරෝති අනුත්තරෝ තමන් වහන්සේට වඩා උසස් කෙනෙක් නැති නිසයි අනුත්තර කියන්නෙ. තථාගතයන් වහන්සේ ලෝකයේ සියලුම දෙවියන්ට මිනිසුන්ට වැඩිය ගුණ ධර්ම පහකින් උසස්. උන්වහන්සේ සෑම දෙනෙකුටම වඩා සීලය , සමාධිය , ප්‍රඥාව, විමුක්තිය, විමුක්ති ඤාණ දර්ශනය කියන ගුණ ධර්ම පහෙන් උසස්. සිල්වත් බවින් උන්වහන්සේට සමාන කරන්න පුළුවන් කෙනෙක් නෑ. අනික් ගුණ ධර්ම වලිනුත් එහෙමයි.

පුරිස දම්ම සාරථී කියන්නේ පුරුෂයන් දමනය කිරීමේ රියදුරා කියන එකයි. රියදුරා විසින් රථයක් නියමිත ස්ථානයට ආරක්ෂිතව රැගෙන යනව. අන්න ඒ වගේ තථාගයන් වහන්සේ තමන් වහන්සේ ළඟට එන අයව ඉතාම ක්‍රමානුකූලව නිවන වෙතට එක්ක යනව.

දවසක් උන්වහන්සේ ජේතවනාරාමයේ බණ කියමින් ඉන්නවා. ඒ වෙලාවෙ ලස්සන දිව්‍ය පුත්‍රයෙක් ඇවිල්ලා මිනිසුන්ට පේන්නම බුදුරජාණන් වහන්සේට වන්දනා කළා. උන්වහන්සෙ අහනව

ඉර්ධිබල තියෙන මහා දිව්‍ය සම්පත් ලබල තියෙන, සියලු දිශාවන් බබළවන, හරිම ලස්සන උසස් ශරීර වර්ණයක් ඇතුව මගේ පාද වන්දනා කරන ඔබ කවුද කියලා.

ඒ දිව්‍ය පුත්‍රයා කියනව. "බුදුරජාණන් වහන්ස අර ගග්ගරා පොකුණ දිහා බලන්න. හරක් බලන ළමයෙක් හරක්ට ගහන ලීය බිම තියාගෙන බණ අහනව. ඒ ළමයගේ කෙවිටට යටවෙලා ගෙම්බෙක් මැරිල ඉන්නවා. ඒ මැරිල ඉන්නෙ මම. මම ඔබ වහන්සෙ කියන බණ වල ශබ්දයට ආශාවෙන් අහගෙන හිටිය. එතකොට බණ අහන්න

ළමයා කෙළිට බිමට තද කරගෙන බණ අහන්න පටන් ගත්ත. එයා කෙළිට තිබ්බේ මගෙ පිට උඩ. මම තදවෙලා ම මැරුණ. බණ අහගෙන හිටිය හින්දා දෙව්ලොව ගියා කියල. " උන්වහන්සේ මේ දෙව් කෙනාට ධර්මය දේශනා කළා. බණ අහන්න පෙර එයා හිටියෙ පෘථග්ජනව . බණ අහලා ඉවරවෙන කොට සෝවාන් ඵලය ලැබුව. මේ වගේ උන්වහන්සේ ලගට ඇවිල්ල දමනය වෙච්ච පිරිස අනන්තයි. අප්‍රමාණයි.

ඇත්තු දමනය කරන කෙනෙක් මුලින්ම ඇතාව එක දිගාවකට එක පැත්තකට ම දුවවනවා. නමුත් තථාගතයන් වහන්සේ බණ කියන ආසනයේ ඉදගෙනම බණ අහන අය අට දිගාවකට දුව වනවා. අට දිගාව කිව්වෙ අෂ්ට සමාපත්ති. හැමෝටම අෂ්ට සමාපත්ති ලබන්න බෑ. ඒ අය මාර්ග ඵල ලාභීන් පමණක් කරනව.

මාගේ භාග්‍යවතුන් වහන්සේ අදාන්ත පුද්ගලයින් ශාන්ත දාන්ත නිකෙලෙස් මහා මුනිවරයන් කරමින් දමනය කළා. උන්වහන්සේ අනුත්තර පුරිස දම්ම සාරථි ගුණයෙන් යුක්තයි. දැන් අපි මේ ගුණය සිහි කරමු. කවුරුත් ඔය ඉන්න ඉරියව්වේම ඉදගෙන ඇස් පියාගන්න. මේ විදිහට හිතන්න.

- මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ සියලු ම දෙව් මිනිසුන්ට වඩා සිල ගුණයෙන් අනුත්තර වන සේක.
- සමාධි ගුණයෙන් අනුත්තර වන සේක.
- ප්‍රඥා ගුණයෙන් අනුත්තර වන සේක.
- විමුක්ති ගුණයෙන් අනුත්තර වන සේක.
- විමුක්ති ඥාණ දර්ශන ගුණයෙන් අනුත්තර වන සේක.
- කිසිවෙකුට සම කළ නොහැකි ගුණ ඇති නිසා "අසම වන" සේක.
- අතීතයේ වැඩ සිටි "අසම" නම් වූ බුදුවරුන්ට පමණක් සම කළ හැකි නිසා අසම සම වන සේක.

- තමන් වහන්සේගේ රූපය බුදු ප්‍රතිමාවක් කළ නොහැකි නිසා "අප්‍රතිම" වන සේක.
- ඔබ දෙසූ ධර්මය එසේ නොවේය කියා විරුද්ධ විය හැකි කෙනෙකු නැති නිසා "අප්‍රතිභාග" වන සේක.
- ඔබ බුදු කෙනෙකු නොවේ. මම සම්මා සම්බුද්ධ වෙමියි කිව හැකි කෙනෙකු නැති නිසා "අප්‍රතිපුද්ගල" වන සේක.
- දමනය කළ යුතු වූ දිව්‍ය, මනුෂ්‍ය, බ්‍රහ්ම, යක්ෂ, රාක්ෂ, සිද්ධ විද්‍යාධර ආදීන් දමනය කළ නිසා පුරිස දම්ම සාරථි වන සේක.

බුදු රජාණන් වහන්සේ අනුත්තරෝ පුරිස දම්ම සාරථි වන සේක.. ///

හත්වන බුදු ගුණය

ඊලඟ බුදුගුණය "සත්ථා දේව මනුස්සානං" සත්ථා කියනනේ ගැල්කරුවාට. ඉස්සර දඹදිව හරිම ලස්සනයි. එක පලාතකින් තවත් පලාතකට බඩු අරගෙන යන්නේ හරක් බැඳපු කරත්ත වලින්. එක දිගට ගොන් කරත්ත 500 ක් විතර යනව. එහෙම කරත්ත ගොඩාක් යනවට කිව්වෙ ගැල් සාත්තුව කියල. ඒ කරත්ත එකක් පස්සෙ එකක් විදිහට පේලියට ගියේ. ඉස්සෙල්ලම යන කරත්තෙ ඉන්නේ පාර පෙන්වන "ගැල්කරුවාණෝ" . එයාට තමයි මේ ඔක්කොම කරත්ත වල වල වගකීම තිබුණෙ. මේ කරත්ත ගමන් කරන්නෙ රෑට. දවල් දවසේ විවේක ගන්නව. මේ ගැල් කරුවාණෝ රාත්‍රී කාලයේ අවදි වෙලා ඉදලා තරු දිහා බලලා පාර හොයාගෙන තමන්ගේ කරත්තෙ නියම මාවතේ ඇරගෙන යනවා. ඒ කරත්තෙ පිටුපස තියෙන කරත්ත ඒක පස්සෙන් එනව. ගැල්කරු හැම කරත්තයක් ම උපද්‍රවයක් , කරදරයක් වෙන්නේ නැතුව කාන්තාරවලින් එක්ක යන්න ඕනි.

කාන්තාර වර්ග හතරක් තියෙනවා. වැලි තියෙන ගස් නැති කාන්තාර වලට කියන්නේ වාලුකා කාන්තාර කියලා. සමහර කාන්තාරවල සැතපුම් ගණනක් යනකම් වතුර නෑ. ඒවාට කියන්නේ නිරුද්දක කාන්තාර කියල. සමහර කාන්තාර වල ගස් තියෙනවා. හැබැයි ඔය හම්බන්තොට පැත්තේ වගේ හරිම වෙලිච්ච කටු පඳුරු සහිත ගස්. ඒ කාන්තාර වල දරුණු කොටි, වලසුන්, සිංහයින්, ව්‍යාඝ්‍රයින් ඉන්නවා. දරුණු වන සතුන් ඉන්න කාන්තාර වසාල කාන්තාර කියලයි හඳුන්වන්නේ. සමහර කාන්තාර වල අමනුස්සයෝ ඉන්නවා. ඒවා අමනුස්ස කාන්තාර . අර කියපු ගැල්කරු මේ කාන්තාර හතරෙන්ම විපතක් වෙන්න දෙන්නේනැතුව තම ගැල්ටික ආරක්ෂා කරගෙන කාන්තාරවලින් එතෙර කරවනව.

බුදුරජාණන් වහන්සේ හරියට ගැල්කරුවාණෝ වගේ. උන් වහන්සේ තමන් ලඟට එන දෙවියන් මිනිසුන් ඉපදීම නැමැති ජාති කාන්තාරයෙන් සත්වයෝ එතෙර කරවනව. වයසට යාම නැමැති ජරා කාන්තාරයෙන් සත්වයෝ එගොඩ කරවනව. ලෙඩවීම නමැති ව්‍යාධි කාන්තාරයෙන් සත්වයෝ එගොඩ කරවනව. මරණය නමැති මරණ කාන්තාරයෙන් සත්වයෝ එගොඩ කරවනව. ඒකයි උන්වහන්සේට සත්ථා දේව මනුස්සානං කිව්වේ. දෙවියන්, මිනිසුන්ගේ, ගුරුවරයා දෙවියන්, මිනිසුන් සංසාර කාන්තාරයෙන් එගොඩ කරවන ගැල්කරු උන්වහන්සේ දෙවියන්, මිනිසුන් වෙත මෙලොව යහපත ගැන කියල දුන්න. මෙලොව, පරලොව දෙලොව ජයගෙන අමා මහ නිවනට ගමන් කරලා සාදාකාලික සුවය ලබන්න උපදෙස් දුන්න. අපි දැන් සත්ථා දේව මනුස්සානං ගුණය සිහි කරමු. කවුරුත් ඇස් පියාගන්න මේ විදිහට සිතන්න.

❖ මාගේ ස්වාමී වූ, බුදුරජාණන් වහන්සේ මෙලොව යහපත පිණිස, දෙව්මිනිසුන් වෙත, අවවාද , අනුශාසනා කළ සේක.

❖ පරලොව යහපත පිණිස අවවාද , අනුශාසනා කළ සේක.

❖ නිර්වාණ පරමාර්ථය පිණිස අවවාද , අනුශාසනා කළ සේක.

❖ බුදුරජාණන් වන්නසේ සත්ථා දේව මනුස්සානං වන සේක. ///

අට වන බුදු ගුණය

අටවෙනි බුදු ගුණය බුද්ධෝ. බුද්ධෝ කියන්නෙ අවබෝධ කළා කියන එකයි. සම්මා සම්බුද්ධෝ කියලා දෙවෙනි බුදු ගුණෙ තේරුම උන්වහන්සේ චතුරාර්ය සත්‍ය අවබෝධ කලා කියන එක. බුද්ධෝ කියන්නේ අන් අයට අවබෝධ කරවුවා කියන එක. ඒ මහා මුනිවරයා බුදුබව පතාගෙන පාරමී පිරුවෙත් අන්‍ය සත්වයින් වෙත කරුණාවෙන්. උන්වහන්සේ ගේ හිත තුළ නිතරම තිබුණේ මහා උදාර අදහස්. එදා පරත් තෙරෙක් නොපෙනන මහා සාගරයේ අම්මව කරේ තියගෙන . ලෑලි කෑල්ලක ආධාරයෙන් පිනන කොටත් ඒ උතුමා හිතනව.

බුද්ධෝහං බෝධයිස්සාමි
මුත්තෝහං මෝචයේ පරේ
තිණ්ණෝහං තාරයිස්සාමි
සංසාරෝගා මහබ්බයා

මම චතුරාර්ය සත්‍ය අවබෝධ කරගෙන අන් අයට චතුරාර්ය සත්‍ය අවබෝධ කරවනව. මම සංසාර දුකෙන් මිදිලා අන් අයව සසර දුකෙන් මුදවනව. මම සසර තරණය කරල අනික් අය සසර තරණය කරවනව. මේ සංසාරය කියන්නේ මහා භයානක රෝගයක්.

බලන්න උන්වහන්සේගේ අදහස කොච්චර පවිත්‍ර ද කියල. අපිට පුළුවන් ද ජීවත් ව සිටියදී වෙන කෙනෙකුට ඇස් දෙක දෙන්න. බෑ. වෙන කෙනෙක් ජීවත් කරවන්න ශරීරයේ මස් කප කපා දන් දෙන්න පුළුවන්ද? බෑ. අන්මාව, චකුගඩුව දෙන්න පුළුවන් ද? බෑ. ඒ වගේ මහානිය පිං

කරන්න පුළුවන් උදාර අදහස් තියෙන සත්පුරුෂයින්ට විතරයි. තමන්ගේ මුළු ජීවිතයටම අන් අය වෙනුවෙන් කැප කරන එක ලේසි නෑ. අපි දැන් බුද්ධ ගුණය සිහි කරමු. කවුරුත් ඇස් පියාගන්න.

- ❖ මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ දුක්ඛ ආර්ය සත්‍ය අන් අයට අවබෝධ කරවූ සේක.
- ❖ සමුදය ආර්ය සත්‍ය අන් අයට අවබෝධ කරවූ සේක.
- ❖ නිරෝධ ආර්ය සත්‍ය අන් අයට අවබෝධ කරවූ සේක.
- ❖ මාර්ග ආර්ය සත්‍ය අන් අයට අවබෝධ කරවූ සේක.
- ❖ බුදුරජාණන් වහන්සේ බුද්ධ වන සේක ///

නම වන බුදු ගුණය

අවසාන බුදු ගුණය භගවා. උන්වහන්සේ භගවා කියන්නෙ කෙලෙස් බිඳ දැමූ නිසා. හරියට මැටි කළයක් පොළවේ ගහලා බිඳලා කුඩු කරල දානවා වගේ උන්වහන්සේ කෙලෙස් සුණු විසුණු කරල දැම්ම.

භග්ගරාගෝ භග්ගදෝසෝ
භග්ගමෝහෝ අනාසවෝ
භග්ගාස්ස පාපකා ධම්මා
භගවතේන පවුච්චති

ඒ භාග්‍යවතුන් වහන්සේ රාග බිඳ දැමුව. ද්වේශ බිඳ දැමුව. මෝහය බිඳ දැමුව. ලාමක පාපක අකුසල ධර්ම බිඳ දැමුව. ඒ නිසා භගවා නම් වෙනව.

අපි භගවා බුදු ගුණය සිහි කරමු. කවුරුත් ඇස් පියාගන්න. පියාගෙන මෙහෙම හිතන්න.

- ❖ මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ

රාගය බිඳ දැමූ සේක.

- ❖ ද්වේශය බිඳ දැමූ සේක.
- ❖ මෝහය බිඳ දැමූ සේක.
- ❖ ලාමක පාපක අකුසල ධර්මයන් බිඳ දැමූ සේක.
- ❖ බුදුරජාණන් වහන්සේ භගවා වන සේක.///

මම මේ ඉතාම කෙටියෙන් බුදුගුණ කියලා දුන්නෙ. තවත් විස්තර සහිතව බුදුගුණ ඉගෙන ගන්න. ඒ බුදුරජාණන් වහන්සේගේ ගුණ අවබෝධ කරගෙන කවදාවත් වෙනස් නොවන විදිහට පැහැදීම සද්ධාව ඇති කර ගන්න. බුද්ධ රත්නය කෙරෙහි නොසෙල්වන පැහැදීම පළමු වන සෝතාපත්ති අංගයයි. සෝවාන් ඵලයට පත් වෙන්න කැමති කෙනා මේ පැහැදීම අනිවාර්යයෙන්ම ඇති කර ගන්න ඕනී.

ධර්ම රත්නයේ ගුණ

දෙවෙනි සෝතාපත්ති අංගය ධර්ම රත්නය කෙරෙහි නොසෙල්වන පැහැදීම. ධර්මය කියන්නෙ පරියාප්තිය සහ නව ලෝකෝත්තර ධර්මයට. පරියප්.තිය කිව්වේ ත්‍රිපිටකය. නව ලෝකෝත්තර ධර්ම පිළිවෙලින් මාත් සමඟ ම කියන්න.

01. සෝවාන් මාර්ගය
02. සෝවාන් ඵලය
03. සකදාගාමී මාර්ගය
04. සකදාගාමී ඵලය
05. අනාගාමී මාර්ගය
06. අනාගාමී ඵලය
07. අරිහත් ඵලය
08. අරිහත් ඵලය
09. නිර්වාණය

මේ තමයි නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය. මේ ධර්ම තුල ඇති ගුණ අවබෝධ කරගෙන ධර්මය ගැන පැහැදීම ඇති කර ගන්න ඕනී. ධර්මයේ ගුණ හයක් තියෙනවා.

පළවෙනි ගුණය ස්වාක්ඛාත ගුණය යි. ස්වාක්ඛාත ගුණය බහුලව දකින්න තියෙන්නේ ත්‍රිපිටක ධර්මය තුල. ස්වාක්ඛාතෝ කියන්නේ මනා කොට දේශනා කරන ලදී. කියන එක.

අපි කවුරුත් ආර්ය අෂ්ටාංගික මාර්ගය දන්නව .මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ස්වාක්ඛාතයි. ඒ කිව්වෙ මැනවින් දේශනා කරල තියෙනව. ආර්ය අෂ්ටාංගික මාර්ගය ස්වාක්ඛාත වෙන්නෙ මුල මැද අග යහපත් නිසා. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මුල සිලය. මැද සමාධිය. අග ප්‍රඥාව. තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ආර්ය මාවතේ මුල, මැද, අග ඉතා නිවැරදිව දේශනා කළා. ඒ නිසා ආර්ය මාවත ස්වාක්ඛාතය.

බුදුරජාණන් වහන්සේ වදාළ හැම ධර්ම දේශනාවකම මුල , මැද, අග පිරිසිදුයි. පිවිතුරුයි. යහපත්. එම නිසා හැම ධර්ම දේශනාවක් ම ස්වාක්ඛාතයි.

ධර්මයේ තියෙන ඊලඟ ගුණය "සන්දිට්ඨික" ගුණයයි. ස්වාක්ඛාත ගුණය හැර අනික් ගුණ පහ තියෙන්නේ නව ලෝකෝත්තර සද්ධර්මයේ. ඒ කිව්වේ සන්දිට්ඨික , අකාලික, ඒහි පස්සික, ඕපනයික, පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී කියන ගුණ තියෙන්නේ නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය තුළ.

දැන් කවුරුත් මේ වාක්‍ය ටික පාඩම් කර ගන්න.මම කිව්වට පස්සේ කියන්න.

01. නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය, තමා විසින් ම , අවබෝධ කළ යුතුය. එම නිසා සන්දිට්ඨික නම් වන්නේය. ///

02. නව ලෝකෝත්තර ශ්‍රී ස්දධර්මය මාර්ගයට අනතුරුව ඵලය ලබා දෙන නිසා අකාලික නම් වන්නේ ය.///

03. නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ඇවිත් බලන්න කියා කීමට සුදුසු ගුණ ඇති නිසා ඒහි පස්සික වන සේක.///

04. නව ලෝකෝත්තර ශ්‍රී ස්දධර්මය තමා විසින්ම තම සන්තානයේ උපදවා ගත යුතු නිසා ඔපනයික වන සේක.///

05. නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය නුවණැතියන් තමා විසින් ම අවබෝධ කළ නිසා පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි වන සේක.///

මේ විදිහට කියලා අපි ඉගෙන ගත්තෙ ධර්මයේ ගුණ. ධර්මයේ ගුණ හොඳට තේරුම් අරගෙන ධර්මය කෙරෙහි පැහැදීම ඇතිකර ගන්න ඕනි.

සංඝ රත්නයේ ගුණ

තුන්වන සෝතාපත්ති අංගය සංඝ රත්නය කෙරෙහි නොසෙල්වෙන පැහැදීම. සංඝ රත්නය කියන්නෙ තථාගයන් වහන්සේගේ ශ්‍රාවක සමූහයා. උන්වහන්සේලා කොටස් දෙකකට බෙදෙනව. පළවෙනි කොටසි පිළිවෙත් පුරන හතර දෙනා. දෙවෙනි කොටස ඵලයන්ට පත් වූ හතර දෙනා. පාලියෙන් මේ කොස් දෙක හඳුන්වන්නේ මෙහෙමයි .

චත්තාරෝ ච පටිපන්නා
පිළිවෙත් පුරන හතර දෙනයි.
චත්තාරෝ ච ඵලේ ඨිතා
පලයන්ට පත් වූ හතර දෙනයි.

- **පිළිවෙත් පුරන හතර දෙනා කවුද? කියන්න බලන්න.**
  1. **සෝවාන් මාර්ගයේ ගමන් කරන කෙනා.**
  2. **සකදාගාමී මාර්ගයේ ගමන් කරන කෙනා.**
  3. **අනාගාමී මාර්ගයේ ගමන් කරන කෙනා.**
  4. **අරිහත් මාර්ගයේ ගමන් කරන කෙනා.**

  ආයෙමත් කියමු.

- පිළිවෙත් පුරන හතර දෙනා කවුද? කියන්න බලන්න.

1. සෝවාන් මාර්ගයේ ගමන් කරන කෙනා.
2. සකදාගාමී මාර්ගයේ ගමන් කරන කෙනා.
3. අනාගාමී මාර්ගයේ ගමන් කරන කෙනා.
4. අරිහත් මාර්ගයේ ගමන් කරන කෙනා.

ආයෙමත් කියමු.

- පිළිවෙත් පුරන හතර දෙනා කවුද? කියන්න බලන්න.

1. සෝවාන් මාර්ගයේ ගමන් කරන කෙනා.
2. සකදාගාමී මාර්ගයේ ගමන් කරන කෙනා.
3. අනාගාමී මාර්ගයේ ගමන් කරන කෙනා.
4. අරිහත් මාර්ගයේ ගමන් කරන කෙනා.

ආයෙමත් කියමු.

- ඵලයන්ට පත් වූ හතර දෙනා කවුද? මාත් එක්කම කියන්න.

1. සෝවාන් මාර්ගයේ ගමන් කරන කෙනා.
2. සකදාගාමී මාර්ගයේ ගමන් කරන කෙනා.
3. අනාගාමී මාර්ගයේ ගමන් කරන කෙනා.
4. අරිහත් මාර්ගයේ ගමන් කරන කෙනා.

ආයෙමත් කියන්න.

1. සෝවාන් මාර්ගයේ ගමන් කරන කෙනා.
2. සකදාගාමී මාර්ගයේ ගමන් කරන කෙනා.
3. අනාගාමී මාර්ගයේ ගමන් කරන කෙනා.
4. අරිහත් මාර්ගයේ ගමන් කරන කෙනා.

මෙ සංඝ රත්නය අෂ්ටාර්ය පුද්ගල මහා සංඝ රත්නය කියලා හඳුන්වනව.

මෙ මහා සංඝ රත්නය අනන්ත ගුණයෙන් යුක්තයි. උන්වහන්සේලාගේ ගුණ කෙටියෙන් පාඩම් කර ගනිමු. මම කිව්වට පස්සේ කියන්න.

❖ මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේගේ ආර්ය මහා සංඝ රත්නය

1. යහපත් මාර්ගයේ ගමන් කරන නිසා සුපටිපන්න වන සේක./ / /
2. ඇද නැති මාර්ගයේ ගමන් කරන නිසා උජුපටිපන්න වන සේක./ / /
3. නිවන් මාර්ගයේ ගමන් කරන නිසා ඤායපටිපන්න වන සේක./ / /
4. වැදුම් පිදුම් ලැබිය යුතු මාර්ගයේ ගමන් කරන නිසා සාමීචිපටිපන්න වන සේක./ / /
5. දුර සිට ගෙනවිත් සිව්පසය පිදීමට සුදුසු වන නිසා ආහුණෙය්‍ය වන සේක./ / /
6. ආගන්තුකයින් උදෙසා පිළියෙල කරන ලද භෝජනය දීමට සුදුසු වන නිසා පාහුණෙය්‍ය වන සේක./ / /
7. පරලොව සැප පතා දන් දීමට සුදුසු වන නිසා දක්ඛිණෙය්‍ය වන සේක./ /
8. දොහොත් මුදුන් දී වැඳ නමස්කාර කිරීමට සුදුසු වන නිසා අඤ්ජලී කරණීය වන සේක / / /
9. ලෝකයාට පිං කෙතක් වන නිසා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස වන සේක./ / /

මේ විදිහට ගුණ දැනගෙන ම ආර්ය මහා සංඝ රත්නය කෙරෙහි පැහැදීම ඇති කර ගන්න ඕනී.

- හතර වන සෝතාපත්ති අංගය ආර්ය කාන්ත සීලය. ආර්ය කාන්ත සීලය කියන්නේ පංච සීලයටමයි.

දැන් ඔබට දන්නවා, යම් කෙනෙක් සෝවාන් ඵලයට පත් වෙන් කැමතිනම්, මේ අංග හතර ජීවිතය තුළ ඇති කර ගන්න ඕනි කියල. ආයෙමත් කියමු සෝතාපත්ති අංග හතර.

01. බුද්ධ රත්නය කෙරෙහි නොසෙල්වන පැහැදීම.

02. ධර්ම රත්නය කෙරෙහි නොසෙල්වන පැහැදීම.

03. සංඝ රත්නය කෙරෙහි නොසෙල්වන පැහැදීම.

04. ආර්ය කාන්තසීලය.

මේ ගුණ ධර්ම හතර යම් කෙනෙක්ගෙ ජීවිතය තුළ තියෙනවනම්, ඔහු ඉන්නෙ සෝවාන් මාර්ගයෙ. එයාට පුළුවන් සෝවාන් ඵලයට පත්වෙන්න. සෝවාන් ඵලයට පත් වීම සක්විති රජ වෙනවාටත් වැඩිය උතුම් බව රාජ සුත්‍රයේ දේශනා කළා. ඔබ මේ බුද්ධ ශාසනයේ ම

01. නිරයෙන් නිදහස් වෙන්න කැමතිද ? ඔව්

02. තිරිසන් ලෝකයෙන් නිදහස් වෙන්න කැමතිද ? ඔව්

03. ප්‍රේත ලෝකයෙන් නිදහස් වෙන්න කැමතිද ? ඔව්

04. අසුර අපායෙන් නිදහස් වෙන්න කැමතිද ? ඔව්

එහෙනම් මේ සෝතාපත්ති අංග හතර ජීවිතය තුළ ඇති කර ගන්න. හැම දෙනාටම තෙරුවන් සරණයි.

https:www.nipunadhamma.org